# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1959/9 - 2016 මාර්තු මස 23 වැනි බදාදා - 2016.03.23**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### නැගෙනහිර පළාතේ පළාත් සභාව

නැගෙනහිර පළාත් සභාවේ 2009 අංක 02 දරන නැගෙනහිර පළාත් මාර්ගස්ථ මඟී ප්‍රවාහන අධිකාරිය ප්‍රඥප්තිය යටතේ පනවනු ලබන නියෝග හා රෙගුලාසි

2009 අංක 02 දරන නැගෙනහිර පළාත් මාර්ගස්ථ මඟී ප්‍රවාහන අධිකාරිය ප්‍රඥප්තියේ 30 (1), 30 (2).(i), (ii), (iii) වන වගන්තියේ සහ උප වගන්ති වල සඳහන් බලතල ප්‍රකාර පනවනු ලබන නියෝග හා රෙගුලාසි මෙමගින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

Z. A. නසීර් අහමඩ්,
ප්‍රධාන අමාත්‍ය, මුදල් සැලසුම්, නීතිය හා සාමය, පළාත් පාලන හා ප්‍රාදේශීය
පරිපාලන, ග්‍රාමීය සංවර්ධන, සංචාරක හා පරිසර, ගොඩනැගිලි හා ඉදිකිරීම්,
ප්‍රවාහන සහ ග්‍රාමීය කර්මාන්ත හා නිවාස අමාත්‍ය.
නැගෙනහිර පළාත් සභාව.

01 නැගෙනහිර පළාත් සභාවේ 2009 අංක 02 දරන නැගෙනහිර පළාත් මාර්ගස්ථ මඟී ප්‍රවාහන අධිකාරිය ප්‍රඥප්තියේ 30. (1), 30. (2). (i), (ii), (iii) හි ප්‍රකාර පනවනු ලබන නියෝග පහතින් දක්වමි. එය ''2015 අංක 01 දරන, මඟී ප්‍රවාහන කාලසටහන් සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම හා බස් නැවතුම්පළ කළමනාකරණ සේවා නියෝග'' වශයෙන් නම් කරනු ලැබේ. 2015 දෙසැම්බර් මස 01 දින සිට මෙම නියෝග බලාත්මක වූ ලෙස සලකනු ලැබේ.

**02 කාල සටහන් සකස් කිරීම :-**

2.1 නැගෙනහිර පළාත තුළ බස්රථ මඟින්, මඟී ප්‍රවාහනය කරනු ලබන්නේ මඟී ඉල්ලුම, අවශ්‍යතා හා අනෙකුත් කරුණු සැලකිල්ලට ගෙන මාර්ගස්ථ මඟී ප්‍රවාහන අධිකාරියෙන් සකස්කර අනුමත කරනු ලබන ''පොදු කාල සටහන්'' ක්‍රමය අනුවය. කිසියම් මාර්ගයක හෝ කොටසක මඟී අවශ්‍යතා ඉටු කිරීම සඳහා මුළු දවස පුරා ධාවනය කළයුතු බස්රථ ගමන් වාර එක් පොදු සැලැස්මකට අනුව සකස්කර ක්‍රියාත්මක කිරීම පොදු කාලසටහන් ක්‍රමය මඟින් ඉටුකරනු ලැබේ. මෙමගින් ඒ ඒ මාර්ගවල මඟී අවශ්‍යතා හා උවමනාවන් සතුටුදායක ලෙස ඉටුවිය යුතු අතර, අනර්ථකාරී තරගය වැළැක්වීමටත් කාර්යක්ෂම ධාවනයකට හා පාලනයට ඉඩ සැලසෙන පරිදි ධාවකයින් අතර පොදු කාලසටහනේ ධාවන ගමන්වාර සාධාරණ ලෙස බෙදා දීමත් අධිකාරිය විසින් ඉටු කළ යුතු ය.

2.2 පොදු කාලසටහන මගී ඉල්ලුම වෙනස්වීම, කාලීන සේවා අවශ්‍යතා, පරිපාලන පහසුව, සේවා කාර්යක්ෂම කිරීම, නගරාන්තර සම්බන්ධවන සේවා ඇති කිරීම, මගී ආරක්ෂාව හා පහසුකම් වැඩිකිරීම යනාදි විවිධ හේතූන් මත සංශෝධනය කිරීමට මගී ප්‍රවාහන අධිකාරිය ක්‍රියා කළ යුතු ය.

2.3 පොදු කාලසටහන් ක්‍රමයෙන් බැහැරව මගී ප්‍රවාහනය සඳහා බස්රථ යෙදවීමට ඉල්ලීම් ඉදිරිපත් වුවහොත් ගුණාත්මක කාර්යක්ෂම බස් සේවාවක් සඳහා අදාළ ඉල්ලීම වැදගත් වන අවස්ථාවක නැගෙනහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියට ඒ සඳහා විශේෂ අනුමැතියක් ලබාදිය හැකි ය. එවැනි අවස්ථාවක මගී ප්‍රවාහන බස්රථ ධාවනය කළ යුතු ධාවන සැලැස්ම ප්‍රවාහන අධිකාරිය විසින් අනුමත කර තිබිය යුතු ය. එවැනි විශේෂ අනුමැතියකින් තොරව පොදු කාලසටහන් ක්‍රමයෙන් බැහැරව කිසිම පුද්ගලයෙකුට/සමාගමකට/ආයතනයකට/මණ්ඩලයකට මගී ප්‍රවාහනය සඳහා බස්රථයක් යෙදවීම නොකළ යුතු ය.

2.4 පාසල් ළමයින් පමණක් ප්‍රවාහනය කරන පාසල් ගමන්වාර, කාර්යාල සේවා, රාත්‍රී හා අලුයම ධාවනය කිරීමට විශේෂිතව නම් කළ සේවා, තැපැල් හා වෙනත් විශේෂිත සේවා අවශ්‍යතාවය පරිදි පොදු කාලසටහන් වලින් ඉවත්කර ධාවනය කරවීමටද, අධිකාරියට හැකි ය.

2.5 පොදු කාලසටහන් සකස් කිරීමේදී මාර්ග තෝරා ගැනීම, ගමනාන්ත තීරණය කිරීම, මාර්ග අංක නම් කිරීම, මගීන්ගෙන් අයකළ යුතු ගාස්තු සකස් කිරීම, ධාවන කාල පරීක්ෂණ හා ධාවන කාලය තීරණය කිරීම, මගී සමීක්ෂණ පැවැත්වීම, මගී ඉල්ලුම තක්සේරු කිරීම, සේවා නැවත සැළසුම් කිරීම හා සංශෝධනය කිරීම මගී ප්‍රවාහන අධිකාරිය විසින් අවශ්‍ය අවස්ථාවලදී සිදුකල යුතු ය. අදාළ කටයුතු කිරීමේදී අනුගමනය කළ යුතු නිර්නායකයන් මගී ප්‍රවාහන අධිකාරිය මගින් රෙගුලාසි වශයෙන් පනවනු ලැබේ.

2.6 නව සේවාවන් ආරම්භ කිරීමේදී ඒ සඳහා රාජ්‍ය බස් සේවයක් ලබාදිය යුතු ද, නැතහොත් පෞද්ගලික බස් සේවයක් ලබා දිය යුතු ද යන්න ඉදිරිපත් වන ඉල්ලීමේ ස්වභාවය හා ධාවන හැකියාවන් අනුව අධිකාරිය විසින් තීරණය කළ යුතු ය. නව මාර්ග පිළිබඳ සමීක්ෂණ හා තොරතුරු අනුව ගමනාගමන යෝජනාවක් ඉදිරිපත් කළ යුතු අතර, එම යෝජනා සැලකිල්ලට ගෙන සේවා ආරම්භ කිරීමට අවශ්‍ය විධිවිධාන සැලැස්විය යුතු ය.

2.7 වෙනත් පළාත් සභාවක ප්‍රවාහන අධිකාරියේ හෝ වෙන යම් බලපත්‍ර නිකුත් කිරීමේ අධිකාරියක් හෝ ජාතික ගමනා ගමන කොමිෂන් සභාව හෝ මෙම පළාත් සභා බල ප්‍රදේශය තුළට බස්රථයක් ධාවනය කිරීම සඳහා බලපත්‍රයක් නිකුත් කිරීමට අදහස් කරන්නේ නම් ඒ සඳහා නැගෙනහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ එකඟතාවය ලිඛිතව ලබාගත යුතු වේ. එවැනි සේවා පොදු කාලසටහන් ක්‍රමයට බාධාවක් නොවිය යුතු අතර, අනවශ්‍ය තරගකාරීත්වයක් නොවන පරිදි පැවැත්වීමට කටයුතු කිරීම බලපත්‍ර අධිකාරිය හා ධාවකයාගේ වගකීම වේ. පවතින පොදු කාලසටහන්වල සේවා සමග අනර්ථකාරී තරගයක් ඇතිවීම හෝ ඇතිවිය හැකිවීම, වෙනත් සේවා සමග ගැටුම්කාරී තත්වයක් පැන නැගීම හෝ පැනනැගීමට ඉඩ තිබීම, අනෙකුත් ධාවන කාලසටහන් වල ආදායම්වලට ප්‍රබල ලෙස හානි සිදුවන අන්තර් පළාත් සේවාවන් තාවකාලික වශයෙන් හෝ ස්ථිර වශයෙන් ධාවනය කිරීම අත්හිටුවීමට ක්‍රියා කරනු ලැබේ.

**03. කාලසටහන් ක්‍රියාත්මක කිරීම.**

3.1 මගී ප්‍රවාහනය කරනු ලබන සෑම බස් රථයකටම බස් රථයේ අංකය, ධාවනය කළ යුතු ගමන්වාර, බස් පර්යන්තයට ඇතුල් කළයුතු හා පිටවිය යුතු වේලාවන්, කාලසටහන ක්‍රියාත්මක වන දිනය හා අනෙකුත් සියලු විස්තර සහිතව අධිකාරිය විසින් නිකුත් කර ඇති වලංගු කාලසටහනක් තිබිය යුතු අතර, පරීක්ෂා කිරීමකදී ඉදිරිපත් කළ යුතු ය.

3.2 කාලසටහන් ක්‍රියාත්මක කිරීමේදී මගී අවශ්‍යතාවය පිළිබඳ වැඩි අවධානයකින් යුක්තව අවශ්‍ය අවස්ථාවකදී ධාවක පාර්ශ්වයන් සමග සාකච්ඡා කර කාලසටහන් ක්‍රියාත්මක කළ යුතු ය. කාලසටහනේ ගැටලු පවතින්නේ නම් ඒ පිළිබඳ ධාවකයින් අධිකාරිය වෙත දැන්වීමට කටයුතු කළයුතු අතර, සති දෙකක ධාවනයකින් පසු ඒ පිළිබඳ නැවත සමාලෝචනය කර සුදුසු සංශෝධන සහිතව ක්‍රියාත්මක කිරීමට අධිකාරිය කටයුතු කළ යුතු ය.

3.3 බස්රථයට අදාළ කාලසටහනට අනුව බලපත්‍රහිමියා බස්රථය ධාවනය කළ යුතු අතර, හදිසි මාර්ග අවහිරයක් හෝ මාර්ග රාජකාරියේ යෙදී සිටින නිලධාරීන්ගේ උපදෙස් මත හෝ හැර අධිකාරියේ ලිඛිත අනුමැතියකින් තොරව කාලසටහන වෙනස්කර ධාවනය නොකළ යුතු ය. කාලසටහනේ සඳහන් සේවාවක් අතරමගින් හැරවීම හෝ අතරමග නතර කිරීමද නොකළ යුතු ය. සියලුම ගමන්වාර නියමකර ඇති වේලාවට ධාවනය කළ යුතු ය.

3.4 අධිකාරියෙන් සකස් කර අනුමත කර දෙනු ලබන කාලසටහන භාර ගැනීම ප්‍රතික්ෂේප කිරීම හෝ ක්‍රියාත්මක කිරීමෙන් වැලකී සිටීම ධාවකයෙකු විසින් නොකළ යුතු ය.

3.5 ඒ ඒ මාර්ගවල පොදු කාලසටහන් මගින් දිනයක් සඳහා සැලසුම් කර ඇති සියලුම ගමන්වාර නියමිත කාලසටහනට අනුව ධාවනය කරවීම අධිකාරියේ ස්ථාන පාලකවරුන්ගේ හා වේලාසටහන් කරුවන්ගේ ප්‍රධාන කාර්යයන් වන අතර, යම් යම් හේතු මත නියමිත

බස්රථ ධාවනයට නොපැමිණීම නිසා ධාවනයෙන් අඩුවන ගමන්වාර පොරොත්තු බස්රථ හෝ බලපත්‍ර සහිත වෙනත් බස්රථ උපයෝගී කරගෙන ධාවනය කරවීමට ඔවුන් විසින් ක්‍රියා කළ යුතු ය. එසේ ධාවනයට නියමිත බස්රථය එක දිගට දින 14 ට වඩා කාලයක් ධාවනය සඳහා නොපැමිණියහොත් ඒ බව අධිකාරියේ ඉහළ කළමණාකාරීත්වයට වාර්තා කළ යුතු ය.

3.6 පොදු කාලසටහනේ අනුමත සියලුම ගමන්වාර ධාවනය කරවීමට අදාළව අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග වරින් වර අධිකාරිය විසින් රෙගුලාසි වශයෙන් පැනවීමට කටයුතු කරනු ලැබේ. අඩුවන ගමන්වාර ධාවනයට ඉඩසැලසීමේදී අදාළ මාර්ගයේ සියලුම ධාවකයින්ට බෙදී යන පරිදි හෝ අඛණ්ඩ ධාවනය සඳහා ස්ථිර ධාවකයෙකු පත් කිරීම හෝ අධිකාරිය විසින් කළ යුතු ය.

3.7 පොදු කාලසටහනේ එක් පාර්ශ්වයකට නියමිත ප්‍රතිශතයට වඩා අඩු ගමන්වාර සංඛ්‍යාවක් ලැබී ඇති විටෙක කාලසටහන් සංශෝධනයක දී හෝ කරනු ලබන සාධාරණ ඉල්ලීමකට හෝ බස්රථයකට ගමන්වාර ලබා දීමේ දී අඩු ගමන්වාර සංඛ්‍යාවක් ලද පාර්ශ්වයට ප්‍රමුඛතාවය ලබා දීමට අධිකාරියට හැකි ය.

3.8 බස්රථ පර්යන්තයට බස්රථයක් ගෙන යා යුත්තේ මගී වේදිකාවට බස්රථය ඇතුල් කිරීමට නියමිත වේලාවට විනාඩි 5 ත් - 10 ත් අතර අදාළ ලොග් පත්‍රය ලබාගෙන හෝ සටහන් තබාගෙන පිටත් විය යුතු නියමිත වේලාවට බස් ගාලෙන් පිටත් වීමට හැකිවන පරිද්දෙනි.

3.9 වේදිකාවේ බස් රථය නතර කර තබන කාලය තුළ පෝලිමේ සිටින මගීන්ට ප්‍රවේශ පත්‍ර නිකුත් කර බස්රථයට නංවාගත යුතු අතර, අදාළ ලොග් පත්‍රය ලබාගෙන හෝ සටහන් තබාගෙන පිටත් විය යුතු නියමිත වේලාවට බස්රථ පර්යන්තයෙන් පිටත් විය යුතු ය.

3.10 බස්රථය ධාවනයේදී අතරමග වුවමනාවෙන්ම ප්‍රමාදකර මගීන්ගේ ගමන් ප්‍රමාද කිරීම හෝ අන් ධාවකයින්ගේ ගමන්වාර වල ආදායමට හානි වන පරිදි ධාවනය කිරීම නොකළ යුතු අතර, මගී ආරක්ෂාවට හානි විය හැකි පරිදි අධික වේගයෙන් ද ධාවනය කිරීම නොකළ යුතු ය.

3.11 පාසල් සිසුන් ප්‍රවාහනය කිරීම, විශේෂ උත්සව, රැස්වීම් හෝ මහජනතාව එක්රැස්වන අවස්ථාවල පොදු කාලසටහන් ක්‍රමයට අතිරේක ගමන්වාර අවස්ථානුකූලව යෙදවීමට අධිකාරියට හැකි ය.

3.12 කිසියම් බස්රථයකට ලබා දී ඇති කාලසටහනක අනිවාර්යයෙන් ධාවනය කළ යුතු බවට සටහන් කර ඇති ගමන් වාර අඛණ්ඩව ධාවනය කිරීමට බලපත්‍රධාරියා විසින් සෑම ක්‍රියාමාර්ගයක්ම ගත යුතු ය.

3.13 එක් එක් ධාවකයා කළ යුතු ගමන්වාර ධාවන අංක අනුව වෙන්කර දී ඇති අතර, වෙන්කරදී ඇති ගමන්වාර මාරුකර ධාවනය නොකල යුතු ය. එවැනි වෙනස් කිරීමක් අවශ්‍යවන්නේ නම් අධිකාරිය වෙත ඉදිරිපත් කර ධාවන අංක වල ගමන්වාර සංශෝධනය කරගත යුතු ය.

**04. බස්රථ පර්යන්ත සංවිධානය හා කළමනාකරණය**

4.1 නැගෙනහිර පළාත් සභා බල ප්‍රදේශය තුළ පොදු කාලසටහන් ක්‍රමයට අනුව ධාවනය වන සියලුම බස්රථ කාර්යක්ෂමව හා සාධාරණ ලෙස පරිපාලනය කර විධිමත් මගී ප්‍රවාහන සේවාවක් මගී ජනතාවට ලබා දීම සඳහා සියලුම බස්රථ පර්යන්ත වල බස්රථ සේවා කළමනාකරණය මගී ප්‍රවාහන අධිකාරිය මගින් ක්‍රියාත්මක කළ යුතු ය.

4.2 ප්‍රවාහන අධිකාරියේ අනුමැතියකින් තොරව වෙනත් කිසිම පුද්ගලයෙකුට හෝ ආයතනයකට බස් රථ පර්යන්තයකට බස්රථ ඇතුල් කිරීම, පිට කිරීම, ලේඛන සටහන් කිරීම හෝ මගීන් නැංගවීමට කටයුතු කිරීම, කෑ ගසා මගීන් එක්රැස් කිරීම, ආසන වෙන් කිරීම හා බස් සේවා කළමනාකරණයට අදාළ කිසිවක් නොකල යුතු ය.

4.3 මගී ජනතාවට ප්‍රමාණවත් හා ගුණාත්මක බස් සේවාවක් ලබා දීමට හැකිවන පරිදි සහ සියලු ධාවකයින්ට ඒ සඳහා ස්ථාන පහසුකම් සලසා දීමට හැකිවන අයුරින් විධිමත් සේවා පරිපාලනය පහසු කිරීමට නැගෙනහිර පළාතේ සියලුම බස්රථ පර්යන්ත නිදහස් පරිහරණය සඳහා මගී ප්‍රවාහන අධිකාරිය වෙත ස්ථිර වශයෙන් හෝ තාවකාලික වශයෙන් පැවරීම හෝ මුදා හැරීම කළ යුතු ය.

4.4 පළාත තුළ ස්ථාපිත සියලුම බස්රථ පර්යන්ත වල නිසි පරිදි සේවා පරිපාලනය කිරීම ප්‍රවාහන අධිකාරියේ වගකීම වේ. එම බස්රථ පර්යන්ත නඩත්තු කිරීම අධිකාරියේ අනුමැතියකට හෝ එකඟතාවයකට අනුව අදාළ පළාත් පාලන ආයතනය විසින් සිදු කළ යුතු ය.

4.5 මගී ප්‍රවාහන බස්රථ සේවා කළමනාකරණය හෝ බස්රථ පර්යන්ත පහසුකම් ලබාදීම වෙනුවෙන් නීත්‍යානුකූලව ප්‍රවාහන අධිකාරියට ගෙවිය යුතු මුදල් හැර, මගී ප්‍රවාහන බලපත්‍ර හිමි ධාවකයෙකු හෝ සේවකයෙකු වෙනත් පුද්ගලයෙකුට හෝ ආයතනයකට කිසිම මුදලක් නොගෙවිය යුතු ය.

4.6 බස්රථ පර්යන්තයක බස්රථ හැසිරවීමට, කළමනාකරණයට උපදෙස් දීම හා විස්තර ලබා ගැනීමට, මගීන්ගේ හා ධාවකයන්ගේ ගැටලුවලට සුදුසු විසඳුම් ලබාදීමට අධිකාරිය විසින් පත් කර ඇති ස්ථානභාර නිලධාරීන්, වේලාසටහන්කරුවන් හා ජංගම පරීක්ෂණ නිලධාරීන් ක්‍රියා කළ යුතු ය.

4.7 බස්රථ පර්යන්ත වල සේවය කරන සියලුම නිලධාරීන් නිල ඇඳුමකින් හෝ ලාංඡනයක් හා අධිකාරිය විසින් නිකුත් කරනු ලබන හැඳුනුම්පතක් සහිතව සේවයේ යෙදිය යුතු ය. එසේ නොමැති කිසියම් පුද්ගලයෙකු හෝ සංවිධානයක් බස් සේවා කළමනාකරණයට සම්බන්ධවීම වැලැක්වීමට හා නීති මගින් ක්‍රියා කිරීමට පොලිස් නිලධාරීන්ට හා අධිකාරියේ නිලධාරීන්ට හැකි ය.

4.8 බස්රථ පර්යන්තයකදී අධිකාරිය විසින් පත් කරන ලද නිලධාරියෙකු විසින් බස් සේවා කළමනාකරණයට අදාළව දෙනු ලබන සියලුම නීත්‍යානුකූල නියෝග හා උපදෙස් බස්රථ පර්යන්තයෙහි අනෙකුත් සියලුම පාර්ශ්වයන් පිළිගත යුතු ය. ඒ අනුව ක්‍රියා කළ යුතු ය.

4.9 බස්රථ පර්යන්තය තුළ මගීන්ගේ, ධාවකයින්ගේ, සේවකයින්ගේ, දැන ගැනීම සඳහා අවශ්‍ය යැයි අධිකාරිය අදහස් කරන ප්‍රචාරක කටයුතු, තොරතුරු සැපයීම, කාලසටහන් ප්‍රදර්ශනය හා වෙනත් කාලීන අවශ්‍යතාවයන්ට ගැලපෙන විස්තර ඉදිරිපත් කිරීමට අධිකාරිය කටයුතු කළ යුතු ය.

4.10 අධිකාරියේ අනුමැතියකින් හෝ එකඟතාවයකින් තොරව බස්රථ පර්යන්තයක හෝ බස්රථයක් තුළ වෙළඳාම් කිරීම හෝ ප්‍රචාරක කටයුතු කිරීම නොකළ යුතු ය.

4.11 බස්රථ පර්යන්තයෙහි මගීන්ට අවහිර වන ලෙස රැඳී සිටීම, නිකරුණේ රැඳී සිටීම, දුම් පානය කිරීම, බීමත්ව හැසිරීම, ප්‍රචාරක කටයුතු කිරීම, නොකල යුතු ය.

4.12 නව බස්රථ පර්යන්ත ස්ථාන ඉදිකිරීමේ දී අධිකාරියේ අනුමැතිය ලබාගත යුතු අතර, නියමිත ප්‍රමිතීන්ට අනුව ඉදිකිරීම් කළ යුතු ය. බස්රථ පර්යන්තයක් බස් සේවා ආරම්භ වන හා අවසන් වන ස්ථානයක් වන අතර, මගීන් නගින බසින හා මාරුවන ස්ථානයක් වශයෙන් සැලකිය යුතු ය. එය සංකීර්ණ බස්රථ සේවා කළමනාකරණ මධ්‍යස්ථානයක් වන්නේ ය. ඒ අනුව බස්රථ සේවා පරිපාලනයට පහසුකම් සැපයීම, මගීන්ට අවශ්‍ය පහසුකම් සැපයීම, බස්රථ ගාල් කිරීමට පහසුකම් හා සේවක පහසුකම් පිළිබඳ මූලික අවධානය ඇතිව ඉදිකිරීම් කළ යුතු ය. බස්රථ පර්යන්තයක අත්‍යාවශ්‍ය මූලික කරුණු වලට බාධාවන හෝ පරිපාලනයට ගැටලු පැන නගින බාහිර ඉදිකිරීම් හෝ ක්‍රියාකාරකම් පැවැත්වීම නොකළ යුතු ය.

4.13 මෙම නියෝග ක්‍රියාත්මක කිරීම වැලැක්වීම හෝ කඩ කිරීම වරදක් වන අතර ප්‍රඥප්තිය ප්‍රකාර ඒ සඳහා නීත්‍යානුකූලව කටයුතු කරනු ලැබේ.

4.14 පොදු කාලසටහන් ක්‍රමය යටතේ නැගෙනහිර පළාත් බලප්‍රදේශය තුළ මගී ප්‍රවාහන අධිකාරිය මගින් බස්රථ සේවා කළමනාකරණය කරනු ලබන බස්රථ පර්යන්ත ස්ථාන උපලේඛන 1 හි ඇතුලත් වේ.

## *උපලේඛනය I*

1. **අම්පාර දිස්ත්‍රික්කය :**

   1.1 අම්පාර ප්‍රධාන බස්රථ පර්යන්තය.
   1.2 කල්මුනේ බස්රථ පර්යන්තය.
   1.3 අක්කරෙයිපත්තුව බස්රථ පර්යන්තය.
   1.4 තිරුක්කෝවිල් බස්රථ පර්යන්තය.
   1.5 පොතුවිල් බස්රථ පර්යන්තය.
   1.6 පානම බස්රථ පර්යන්තය.
   1.7 මහඔය බස්රථ පර්යන්තය.
   1.8 පදියතලාව බස්රථ පර්යන්තය.
   1.9 දෙහිඅත්තකණ්ඩිය බස්රථ පර්යන්තය.

**2. මඩකළපුව දිස්ත්‍රික්කය :**

2.1 මඩකළපුව ප්‍රධාන බස්රථ පර්යන්තය.
2.2 කොක්අඩිචෝලෙයි බස්රථ පර්යන්තය.
2.3 කළුවාංචිකුඩි බස්රථ පර්යන්තය.
2.4 ආරියම්පති බස්රථ පර්යන්තය.
2.5 කාත්තන්කුඩි බස්රථ පර්යන්තය.
2.6 වෙන්කල්ලඩි බස්රථ පර්යන්තය.
2.7 පිල්ලුමලේ බස්රථ පර්යන්තය.
2.8 වාලච්චේන බස්රථ පර්යන්තය.

**3. ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය :**

3.1 ත්‍රිකුණාමලය ප්‍රධාන බස්රථ පර්යන්තය.
3.2 මූතූර් බස්රථ පර්යන්තය.
3.3 කින්නියා බස්රථ පර්යන්තය.
3.4 කන්තලේ බස්රථ පර්යන්තය.
3.5 පුල්මුඩේ බස්රථ පර්යන්තය.
3.6 පදවි - ශ්‍රී පුර බස්රථ පර්යන්තය.

04 - 431

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.